ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ධීවර නිලධාරීන් සඳහා විද්‍යුත් යතුරුපැදි සැපයීම සඳහා වන අවබෝධතා ගිවිසුමකට අත්සන් තබයි

ධීවර අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා විද්‍යුත් යතුරුපැදි 430ක් සැපයීම සඳහා වන අවබෝධතා ගිවිසුමකට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා සහ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය බී. කේ. කෝලිත කමල් පිනදාස මැතිතුමා විසින් අත්සන් තබන ලදී. අවබෝධතා ගිවිසුම ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිතුමා ඉදිරියේදී අත්සන් තබන ලදී.

2. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි අවබෝධතා ගිවිසුම යටතේ ඉන්දීය රජය විසින් ධීවර සහ සාගර සම්පත් දපෝර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) යන ආයතන ඇතුළු විවිධ ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා විද්‍යුත් යතුරුපැදි සැපයීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 265ක ප්‍රදානයක් ලබා දෙනු ඇත.

3. මෙම විද්‍යුත් යතුරුපැදි ලබාදීම තුළින් ධීවර නිලධාරීන්ගේ මහෙයුම් හැකියාවන්, කාර්යක්ෂමතාවය සහ ක්ෂේත්‍ර කර්තව්‍යයන් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරෙේ. ප්‍රතිචාර ලබා දීමේ කාලය වඩාත් කඩිනම් කිරීම සහ ධීවර ප්‍රජාවන් සමඟ නිරන්තර නියැලීම සඳහා පහසුකම් ලබා දීම තුළින් මෙම මූලපිරීම හරහා ශ්‍රී ලංකාව පුරා පොදු සේවා සැපයීම වැඩි දියුණු කිරීමට ද අපේක්ෂා කරෙේ. එසේම, මෙම වැඩසටහන ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ දැක්ම යටතේ ක්‍රියාත්මක ‘ක්ලීන් ශ්‍රී ලංකා’ වැඩසටහනේ පරිසර තිරසාරත්වය යන අංශයට ද දායකත්වය ලබා දෙයි.

4. ශ්‍රී ලංකා ජනතාවගේ අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන් මත පදනම් වන ඉන්දියාවේ ජනතා කේන්ද්‍රීය සංවර්ධන හවුල්කාරිත්ව වැඩසටහන් දිවයිනේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය, ධීවර, ප්‍රවාහන, පුනර්ජනනීය බලශක්තිය, ජීවනෝපාය, කෘෂිකර්මාන්තය වැනි ක්ෂේත්‍ර රැසක පුරා ජනතාවගේ දෛනික ජීවිතය තුළ සුබවාදී වෙනසක් ඇති කරමින් තවදුරටත් ක්‍රියාත්මකය.

***

2026 ඔක්තෝබර් ***30***
කොළඹ